# නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය

# වරාය නගර සංවර්ධන ව්‍යාපෘතිය

# පුරප්පාඩුව

**ව්‍යාපෘති විස්තරය :**

01. කොළඹ ජාත්‍යන්තර මූල්‍ය නගර ව්‍යාපෘතිය (වරාය නගර ව්‍යාපෘතිය) ක්‍රියාත්මක කිරීම සඳහා නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය (ශ්‍රී ලංකා රජය වෙනුවෙන්), නාගරික සංවර්ධන අධිකාරිය (UDA) සහ CHEC Port City Colombo Pvt. Ltd. (ව්‍යාපෘති සමාගම) යන පාර්ශ්ව තුන අතර ත්‍රෛපාර්ශ්වික ගිවිසුමක් අත්සන් තබන ලදී. මෙම ත්‍රෛපාර්ශ්වික ගිවිසුම යටතේ, ශ්‍රී ලංකා රජයට විශාල වගකීමක් පැවරේ. ශ්‍රී ලංකා රජය වෙත පැවරෙන වගකීම් සම්බන්ධීකරණ, කළමනාකරණය, නිරීක්ෂණය සහ අධීක්ෂණය සඳහා අමාත්‍යාංශය විසින් ව්‍යාපෘති කළමනාකරණ ඒකකයක් පිහිටුවන ලදී.

02. **පිරවීමට නියමිත පුරප්පාඩුව පවතින තනතුර :**

| තනතුරු | | පුරප්පාඩුව පවතින තනතුරු සංඛ්‍යාව | 01/2019 චක්‍රලේඛය අනුව වැටුප් කාණ්ඩය |
|---|---|---|---|
| 01 | **ව්‍යාපෘති ලේකම්** | 01 | PS - 6 |

03. රාජ්‍ය කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක : 01/2019 අනුව, ඉහත තනතුරු සඳහා අයදුම් කිරීම සඳහා සුදුසුකම් ලැබීමට පහත සඳහන් සුදුසුකම් වලින් එකක් සපුරා තිබීම අවශ්‍ය වේ.

| අංකය | තනතුර | වැටුප් කාණ්ඩය | සුදුසුකම |
|---|---|---|---|
| 01 | **ව්‍යාපෘති ලේකම්** | PS - 6 | **(පහත 01 හෝ 02)**<br>01. ඉංග්‍රීසි සහ සිංහල/දෙමළ භාෂාව ඇතුළුව විෂයන් තුනකට (3) සම්මාන සාමාර්ථ සහිතව අ.පො.ස. (සා/පෙළ) විභාගය විෂයන් හයකින් (6) සමත්ව තිබීම සමග<br>පිළිගත් ආයතනයකින් ලේකම් පරිචය පාඨමාලාවක් හෝ වරලත් ලේකම්කරණය පිළිබඳ පාඨමාලාව හැදෑරීම<br>**සමග**<br>අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 06ක පළපුරුද්ද ලබා තිබීම.<br>02. අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 05 ක පළපුරුද්ද සහිත වරලත් ලේකම්වරයෙක් |

04. **සාමාන්‍ය කොන්දේසි :**
අයදුම්කරුවන් ශ්‍රී ලාංකික පුරවැසියන් විය යුතු අතර, වයස අවුරුදු 65 කට නොවැඩි වියයුතුය.

05. **වැටුප :**
2019.03.15 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2019 සහ අනෙකුත් අදාළ කළමනාකරණ සේවා චක්‍රලේඛවල සඳහන් පරිදි වැටුප ගෙවනු ලබන අතර, එයට අතිරේකව, එකී චක්‍රලේඛයේ සඳහන් දීමනා සහ වරප්‍රසාද වලට හිමිකම් ලබයි.

06. **අයදුම් කිරීම සඳහා කොන්දේසි :**
රජයේ සේවයේ යෙදී සිටින අයදුම්කරුවන්ට කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 2019/01 හි 2:3:3 වගන්තියේ (ආ) ඡේදය අනුව අයදුම්කළ හැකි අතර, රජයේ සේවකයන් නොවන අයදුම්කරුවන් කොන්ත්‍රාත් පදනම මත බඳවාගනු ලැබේ. රජයේ සේවයේ යෙදී සිටින අයදුම්කරුවන් අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානීන් හරහා සිය අයදුම්පත් ඉදිරිපත් කළයුතුය.

07. **අයදුම්පත් :**
සුදුසුකම්, පළපුරුද්ද සහ දුරකථන අංකය හා විද්‍යුත් ලිපිනය (තිබේ නම්) ඇතුළු අනෙකුත් අදාළ තොරතුරු සහිතව A4 ප්‍රමාණයේ කඩදාසිවල සකස් කරන ලද අයදුම්පත් 2020.11.25 දිනට හෝ එයට පෙර පහත ලිපිනයට ලැබෙන පරිදි ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු අතර, රජයේ / රාජ්‍ය–නොවන ආයතනවල අයදුම්කරුවන් අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානීන් හරහා අයදුම්පත් ඉදිරිපත් කළ යුතු අතර, සෘජුව ඉදිරිපත් කරන අයදුම්පත් පහත ලිපිනයට එවිය යුතුය. ලිපි කවරයේ වම්පස කෙළවරේ අයදුම් කරන තනතුරේ නම සඳහන් කළ යුතුය.

**ලේකම්,**
**නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය,**
**17 වන මහල, සුහුරුපාය, බත්තරමුල්ල.**

Source: Dinamina, Daily News (2020.11.11)